2013 ජනවාරි 20 වැනි දා 'කලම්බු ටෙලිග්‍රාෆ්' වෙබ් අඩවියේ පළවූ
End Of Constitutional Governance In Sri Lanka: Gaddafi Also Said "The People Love Me"
ලිපියේ සිංහල පරිවර්තනය

# ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාමය ආණ්ඩුකරණයේ අවසානයඃ ''ජනතාව මට ආදරෙයි'' කියා ගඩාෆි ද කීවේය.

ආචාර්ය නිහාල් ජයවික්‍රම

2011 ලිබියානු විප්ලවයේ උච්චතම අවස්ථාවේ දී, තමන්ගේ යටතට ඇතැම් පළාත් පත්ව ඇති බවට කැරලිකරුවන් කී කතා ගඩාෆි විශ්වාස නොකළ බව කියැවේ. රටේ අගනගරය වන ට්‍රිපොලි නුවර කැරලිකරුවන් වට කරමින් තිබියදී පවා ඔහු බී.බී.සී. ප්‍රවෘත්ති සේවයට කීවේ, ''ජනතාව මට ආදරෙයි'' කියා ය. ලිබියානු රාජ්‍ය මාධ්‍ය මගින් බොරු ප්‍රවෘත්ති ප්‍රචාරය මොන තරම් දුරකට ආයතනගත කර තිබිණි ද යත්, එම බොරුව නිර්මාණය කළ බලවත්තු පවා තමන්ගේම බොරුව විශ්වාස කරන මට්ටමට පත්වූහ. තිත්ත ඇත්ත ඔවුන්ට මුණගැසෙන විට පෙරහැර ගොස් තිබුණි. කැරලිකාරී සැහැසි ජනයා නගර විනාශ කළෝය. මාළිගා බිමට සමතලා කළෝය. මේ සියල්ල, සිද්ධියට පෙරාතුවත් ඉන් පසුවත්, මම දැක්කෙමි.

පසු ගිය මාස දෙකක කාලය තිස්සේ, පාලකයා තුළ අපහසුව දනවූ අගවිනිසුරුවරියක් ඉවත්කොට, පාලකයාට හීලෑ අගවිනිසුරුවරයෙකු පත්කර ගැනීමට ගෙන ගිය ව්‍යාපාරය තුළ, අපේ රටේ රාජ්‍ය මාධ්‍ය ආයතන ද එවැනිම විසකුරු ප්‍රවෘත්ති ප්‍රචාරයක් දියත් කෙළේය. තමන් ගොතන බොරුව තුළ සැඟව ඇති සිද්ධිය අනීතික වන බවවත්, ව්‍යවස්ථා විරෝධී වන බවවත් එහි දී සැලකිල්ලට නොගැනුණි. ඒ මගින්, ප්‍රජාතන්ත්‍රීය ආණ්ඩුකරණයේ පදනම් පවුරු දෙදරති යි යන තැකීමක් ද නොවුණි. අගවිනිසුරුවරියව කෙසේ හෝ පන්නා දැමිය යුතුව තිබුණි. රාජ්‍ය මාධ්‍යයෙන් සහ කැබිනට් ඇමතිවරුන් වෙතින් නොමිලේ සැපයුණු පල්හෑලි, ඒ අනුව, ජනතාව නැලවීම එල්ල කරගෙන බෙදා හැරුණේය. ආණ්ඩුවේ සාමාජිකයන් පවා ඒ පට්ටපල් බොරුව විශ්වාස කරන්නට යෙදුණි. මේ සාවද්‍ය ප්‍රචාරණයෙන් නැලවිල්ලට පත් එක කැබිනට් ඇමතිවරයෙක්, ''ශ්‍රේෂ්ඨාධිකරණය මකබෑවෙද්දෙං/'' යි කීය.

## <u>යල්පීනූ දෝෂාභියෝගය</u>

''දෝෂාභියෝගය'' යන්න, අගවිනිසුරුවරිය ඉවත් කිරීම සඳහා වන ක්‍රියාවලිය තුළ ඔක්තෝබර් මැද භාගයේ අපේ දේශපාලන ශබ්දකෝෂයට හඳුන්වා දෙන ලද වචනයකි. එම වචනයට ඓතිහාසික බරක් තිබේ. නීතිය පිළිබඳ මහාචාර්යවරු සහ තීරුලිපි රචකයෝ ලෝකය පුරා 'දෝෂාභියෝගයේ' ඉතිහාසය පිළිබඳ කරුණු පිරික්සමින්, මේ කියන දෝෂාභියෝග ක්‍රියාවලියට අතපෙවීමට කිසි අධිකරණයකට බලයක් නැති බවට තර්ක කරන්නට වූහ. ඒ අනුව, ඇමරිකා එක්සත් ජනපදයෙන් ආදර්ශයක් ගෙනහැර දැක්වුණි. අප්‍රකට මිසිසිපි පළාතේ, බොරු දිව්රුම් සාක්ෂි දී වැරදිකරුවෙකු වූ රොබට් නික්සන් නැමැති දිස්ත්‍රික් විනිසුරුවරයෙක් ඔහුට එරෙහිව සෙනේට් සභාවෙන් සම්මත කරගන්නා ලද දෝෂාභියෝගයක් ශ්‍රේෂ්ඨාධිකරණය ලවා සමාලෝචනය කරගැනීමට අසාර්ථක උත්සාහයක් ගත්තේය. ඔහුගේ තර්කය වුණේ, තමා පිළිබඳ විමර්ශනය පළමුවෙන් කළ යුතුව තිබුණේ සෙනේට් සභාවෙන් මිස නියෝජන මන්ත්‍රී මණ්ඩලයෙන් නොවන බව යි. එහෙත්, ඇමරිකා එක්සත් ජනපදයේ 1787 ව්‍යවස්ථාවකින් ගෙනහැර දක්වන ලද දෝෂාභියෝග ක්‍රියාවලියක් අපට දක්වන අදාළත්වය කුමක් ද? විශේෂයෙන්ම, අප ඇමරිකාවේ 51 වැනි ප්‍රාන්ත රාජ්‍යය වීමට නොබලන කල?

එංගලන්තයේ විනිසුරුවරුන් දෝෂාභියෝගයට ලක්කෙරෙන්නේත් පාර්ලිමේන්තුවෙන් බව තවදුරටත් මේ අය පෙන්වා දුනි. එහෙත් 'වංශාධිපතියෙකු' හෝ 'මහජන මන්ත්‍රීවරයෙකු' නීතිය ඉක්මවා ගිය අනාචාරයක් හෝ බරපතල අපරාධයක් සම්බන්ධයෙන් චෝදනා ලද විට, ඉතිහාසයේ යම් කාලයක දී දෝෂාභියෝග ක්‍රියාවලියක් වෙත යොමුව ඇතත්, මේ වන විට එම රටේ පවා එය යල්පීනූ ක්‍රියාවක් බවට පත්ව ඇති බව මේ අය පෙන්වා දුන්නේ නැත. උදාහරණයක් වශයෙන්, 1802 න් පසු, එංගලන්තයේ දෝෂාභියෝගයක් කරලියට විත් නැත. කෙසේ වෙතත්, එක්සත් රාජධානිය පාලනය වන්නේ, සම්ප්‍රදාය සහ අණපනත් නීතිය යටතේ මිසක් ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යටතේ නොවන බව සිහියේ තබාගත යුතුව තිබේ.

අපට ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තිබේ. එම ව්‍යවස්ථාවේ කිසිම ආකාරයක දෝෂාභියෝගයක් ගැන සඳහන් වන්නේ නැත. ව්‍යවස්ථාවේ එක තැනක හෝ 'දෝෂාභියෝගය' යන වචනය නැත. ව්‍යවස්ථාවේ 107 වැනි වගන්තියෙන් කියැවෙන්නේ, ''යම් කිසි විනිශ්චයකාරවරයෙකු ඉවත් කිරීම සඳහා ඔප්පු වී ඇති විෂම පැවැත්ම හෝ අබලතාව හෝ පදනම් කොටගෙන....පාර්ලිමේන්තුවේ යෝජනාවක් ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබීමෙන් පසු ජනාධිපතිවරයා විසින් කරන ලද නියමයකින් හැර විනිශ්චයකාරවරයෙකු ඉවත් කළ නොහැක්කේය.'' යනුවෙනි. දෝෂාභියෝගයක් ගැන කතාවක් එහි නැත. පැහැදිළිවම මේ යෙදුම අපේ රටට හඳුන්වා දී ඇත්තේ, ඇමරිකාවෙන් සහ වෙනත් එවැනි තැන්වලින් ඊට ඈඳාගත හැකි කදමළු, යම් පුද්ගලයෙකුගේ නෛතික අයිතිවාසිකම්වලට නරකට බලපාන කරුණකට එරෙහිව අධිකරණමය

සමාලෝචනයක් ඉල්ලා සිටීමට එම පුද්ගලයාට ඇති ව්‍යවස්ථාමය අයිතිය අභියෝග කිරීම සඳහා පාවිච්චියට ගැනීම අරමුණු කරගෙන ය.

## ව්‍යාජ උත්තරීතරත්වය

පාර්ලිමේන්තුව උත්තරීතර යැයි කියැවුණේ කිසිම පදනමකින් තොරවයි. ශ්‍රේෂ්ඨාධිකරණය ආශ්‍රයෙන් හැරුණු කොට, 'උත්තරීතර' යන වචනය ව්‍යවස්ථාව තුළ හමුවන එකම අවස්ථාව වන්නේ, ව්‍යවස්ථාවේ පූර්විකාව තුළ, රටේ නීතිය වන්නේ ව්‍යවස්ථාව යැයි සඳහන් වන තැන පමණි. 1972 ව්‍යවස්ථාව මෙන් නොව, 1978 ව්‍යවස්ථාව පැහැදිළිව පදනම්ව ඇත්තේ බල විභේදනය මත යි. පාර්ලිමේන්තුවට ව්‍යවස්ථාදායක බලය පැවරෙයි. ජනාධිපතිවරයාට විධායක බලය පැවරෙයි. නීතියෙන් හෝ ව්‍යවස්ථාවෙන් පිහිටුවන ලද අධිකරණ, විනිශ්චය සභා සහ වෙනත් ආයතන වෙත අධිකරණය බලය පැවරෙයි. මේ කියන යම් බලයක් අනිත් බලයට වඩා උත්තරීතර නොවෙනවා පමණක් නොව, ඒවා එකිනෙකට බැඳ තබන මනා තුලන සහ සංවරණ පද්ධතියක් ද ස්ථාපිතව තිබේ. ශිෂ්ට සම්පන්න ලෝකයේ ප්‍රජාතන්ත්‍රීය ආණ්ඩුකරණයේ සාරය එය වන්නේය.

උදාහරණයක් වශයෙන්, ජනාධිපතිවරයා පාර්ලිමේන්තුව කැඳවන්නේය, කල් තබන්නේය, විසිරුවා හරින්නේය. එහෙත්, නීති සම්පාදනය කිරීමට ඔහුට නොහැකිය. නීති සම්පාදනය කළ හැක්කේ (හදිසි නීතිය යටතේ පාර්ලිමේන්තුවේ විශේෂ අවසරයක් ඇති අවස්ථාවක දී හැරුණු කොට) පාර්ලිමේන්තුවට පමණි. එසේ වෙතත්, පාර්ලිමේන්තුව නීති සම්පාදනය සඳහා ගෙනෙනු ලබන පනත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල බවට අධිකරණයෙන් සහතික කෙරෙන තෙක්, එසේ නීති සම්පාදනය කිරීමට පවා පාර්ලිමේන්තුවට නුපුළුවන. කතානායකවරයාට හෝ තේරීම් කාරක සභාවකට ඒ කාර්යය කළ නොහැක්කේය.

විධායක බලය අභ්‍යාස කළ හැක්කේ ජනාධිපතිවරයාට පමණක් වුවත්, ඔහු සතු බලතල සහ වගකීම් නිසි අයුරින් ඉටු කරන්නේ ද යන්න ගැන ඔහු 'පාර්ලිමේන්තුවට වගකිව යුතු' වන්නේය. ඔහුගේ මේ නෛතික ක්‍රියාකාරකම් ඉටු කිරීම සඳහා අවශ්‍ය කරන ප්‍රතිපාදන සපයන්නේ පාර්ලිමේන්තුවයි. මහජන වැදගත්කමකින් යුත් නීති කරුණක් ගැන ප්‍රශ්නයක් පැනනැගුණොත් එය නිරාකරණය කරන්නැ යි ඔහු ඉල්ලා සිටින්නේ අධිකරණයෙන් මිස පාර්ලිමේන්තුවෙන් නොවේ. අල්ලස, විෂමාචාරය, දූෂණය, බලය අපහරණය කිරීම හෝ චේතනාන්විතව ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම මත, පාර්ලිමේන්තුවේ යෝජනාවක් හරහා ජනාධිපතිවරයාව ඉවත් කළ හැකිය. එහෙත් ඒ, එවැනි චෝදනාවක් හෝ චෝදනා කිහිපයක් සම්බන්ධයෙන් වන නිසි පරීක්ෂණයකින් පසු ඔහු වැරදිකරු බවට ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කළ පසුව පමණි. ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව ඇමතිය හැකිය. එහෙත්, කතානායකවරයාගේ නිර්දේශයක් මත ජනාධිපතිවරයාගේ කල්ක්‍රියාව ගැන කෙරෙන පරීක්ෂණයක දී හැරුණුකොට, ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ පෙනී සිටීමට සහ කරුණු දැක්වීමට ජනාධිපතිවරයාට නොහැක. අධිකරණයකින් වරදකරු කරන ලද පුද්ගලයෙකුට සමාව දීමට හෝ අධිකරණයෙන් නියම කරන ලද දඬුවම වෙනත් දඬුවමකට මාරු කිරීමට ජනාධිපතිවරයාට අයිතිය ඇතත්, අධිකරණයකින් දෙන ලද විනිශ්චය ඉවත් කිරීමට ඔහුට නොහැක්කේය.

අධිකරණ බලය පාවිච්චි කළ හැක්කේ අධිකරණයකටම පමණි. එහෙත්, ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ විනිසුරුවරුන් පත්කරන්නේ ජනාධිපතිවරයා ය. ඔහුට ඔවුන්ව ඉවත් කළ හැක්කේ, 'ඔප්පු කරන ලද විෂමාචාරයක් හෝ අබලතාවක්' මත පදනම්ව පාර්ලිමේන්තුව මගින් සම්මත කරගන්නා ලද යෝජනාවක් මාර්ගයෙන් පමණි. ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කළ හැක්කේ ශ්‍රේෂ්ඨාධිකරණයට පමණි. එහෙත් ව්‍යවස්ථාව සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම කළ හැක්කේ පාර්ලිමේන්තුවට ය. ව්‍යවස්ථාමය හෝ අනවධාන කාර්යයන්ට අදාළ පරීක්ෂණයක සඳහා පවත්වන තේරීම් කාරක සභාවක් ඉදිරියට විනිසුරුවරයෙකු කැඳවීමට පාර්ලිමේන්තුවට බලය තිබේ. එසේම, නඩුවක පාර්ශ්වකරුවෙකු, සාක්ෂිකරුවෙකු හෝ චූදිතයෙකු වශයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු අධිකරණය ඉදිරියට කැඳවීමට අධිකරණයට බලය තිබේ.

## සංවේදී බලතුලනයක්

පාර්ලිමේන්තුවට සහ ශ්‍රේෂ්ඨාධිකරණයට පැවරෙන භූමිකාවන් හොඳින්ම පෙන්නුම් කෙරෙන්නේ, පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) පනතිනි. පාර්ලිමේන්තු වරප්‍රසාද කඩකිරීමක දී, 'පාර්ලිමේන්තුවේ අවවාදයක්' හෝ 'පාර්ලිමේන්තු සීමාවෙන් ඉවත් කිරීමක්' හෝ පමණකින් දඬුවම් දිය නොහැකි අවස්ථාවක දී (යමෙකුට එරෙහිව පාර්ලිමේන්තුවට පැමිණවිය හැකි දඬුවම් එපමණි), ඊට වැඩි දණ්ඩනයක් සඳහා අදාළ කාරණය පාර්ලිමේන්තුව මගින් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කළ යුතුව තිබේ. සාක්ෂි දීමක් සඳහා හෝ ලේඛනයක් ඉදිරිපත් කිරීම සඳහා පාර්ලිමේන්තු කාරක සභාවක් ඉදිරියට කැඳවන යමෙකු එසේ පැමිණීමෙන් හෝ අදාළ ලියවිල්ල ඉදිරිපත් කිරීමෙන් වැළකී සිටියොත්, එම පුද්ගලයාට දඬුවම් දීමක් අපේක්ෂා කරන්නේ නම්, එම කාරණයත් ඉදිරිපත් කළ යුත්තේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙතටයි.

එබැවින්, ආණ්ඩුවේ මෙකී අංශ තුන අතර ව්‍යවස්ථාමය සම්බන්ධතාව පවත්වා ගැනීම සඳහා අන්‍යොන්‍ය ගෞරවය අවශ්‍ය කෙරේ. ඉන් එක් අංශයක් අනිත් අංශයට 'මකබෑවෙන්නට' කීම හෝ එක අංශයක විනිශ්චයක් එය 'ලියූ කොළ කෑල්ල තරම්වත් නොවටිනා' බව කීම, ආණ්ඩුකරණයේ නිසි ක්‍රියාවලිය පිළිබඳ ඇති නොදැනුම පෙන්නුම් කරන්නකි. නැත්නම්, නොදැනුම හේතුවෙන් මවාගත්, උද්ධච්ච කම කියාපාන්නකි.

ඉන් එකක්වත් නොවේ නම්, මහජනතාව නොමග යැවීම සඳහා ඉදිරිපත් කෙරෙන බොරුවක ලක්ෂණයකි. එපමණක් නොවේ, එය ආයතනික මතකයේ ඇති අඩුවක් ද වන්නේය.

උදාහරණයක් වශයෙන්, විමර්ශන කොමිසමක සභාපතිත්වය භාර ගැනීම සඳහා එක්තරා විනිසුරුවරයෙකු නම්මා ගැනීමට 1958 දී එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක අගමැතිවරයාට අවශ්‍ය වූ අවස්ථාවේ ඔහු අළුත්කඩේ උසාවි සංකීර්ණයට ගොස්, ශ්‍රේෂ්ඨාධිකරණ පුස්තකාලයේ දී අදාළ විනිසුරුවරුන් මුණගැසුණා මිස, තමාගේ නිවෙසට හෝ කාර්යාලයට ඔවුන්ව ගෙන්වූයේ නැත. 1973 දී තමා මූලාසනය දරණ අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභාවේ (1971 කැරැල්ල) ඇතැම් පරිපාලනමය දුෂ්කරතා ගැන සාකච්ඡාවක් සඳහා අගවිනිසුරු එච්.එන්.ජී. ප්‍රනාන්දු, අගමැතිවරිය හමුවීමට අවස්ථාවක් ඉල්ලා සිටියේය. එහෙත් ඇගේ ආණ්ඩුව පෙරලා දැමීමට තැත් කිරීමේ වරදට චෝදනා ලැබ සිටි පුද්ගලයන්ව විභාග කෙරෙන නඩුවක සභාපතිවරයා වශයෙන් ඇගේ නිවසේ දී (අරලියගහ මන්දිරයේ දී) ඔහු ඇයව මුණගැසීම නොමනා බව ඇගේ තීරණය විය. එබැවින් අධිකරණ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයා වශයෙන් මට ඔහුව හමුවන්නැ යි ඈ කියා සිටියාය. බණ්ඩාරනායක මැතිණිය, ඉහළ උසාවියක විනිසුරුවරයෙකු හෝ අගවිනිසුරුවරයෙකු වීමට නියමිත කිසිවෙකු කවදාවත් පෞද්ගලිකව මුණගැසුණේ නැත. ඒ වෙනුවට ඒ කාර්යය පැවරුණේ අධිකරණ ඇමතිවරයාට හෝ අමාත්‍යාංශ ලේකම්වරයාට ය. බල විභේදනය පසුපස ඇති සම්මත සම්ප්‍රදායයන් අතීතයේ දී අවබෝධ කර ගැනුණේ සහ අනුගමනය කෙරුණේ එයාකාරයෙනි.

විටින් විට ගැටුම් නොතිබුණා නොවේ. 1973 ශ්‍රේෂ්ඨාධිකරණයේ පිළිගැනීමේ සමාරම්භක උත්සවයකට ආරාධනා ලැබ, අධිකරණ ඇමතිවරයාගේ උපදෙස් මත ඔහු ළඟ තිබූ නීතිඥයන් සඳහා වන අසුනක මා වාඩි ගත් අවස්ථාවේ, අගවිනිසුරු තෙන්නකෝන් එය නොමනා බව පෙන්වා දී, පසු පේළියේ අසුනක වාඩි වෙන්නැ යි මට දන්වා සිටියේය. මම එසේ කෙළෙමි. එය, වාඩිවීමට වෙනත් අසුනක් නොතිබූ නිසා සිදුවූවක් නොව. මෙවැනි උත්සවවල දී සාමාන්‍යයෙන් මා වාඩිවුණේ පසු පෙළ ආසනයක යි. යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය තුළ, ව්‍යවස්ථාදායකයට සහ විධායකයටත් පැවරෙන භූමිකාවක් ඇති බව අධිකරණයට අඟවනු වස් එසේ ඉදිරි පෙල අසුනක මා වාඩි වීම සුදුසු බව අධිකරණ ඇමතිවරයාගේ කල්පනාව විය. කෙසේ වෙතත්, එදා ක්‍රියාවට නැගුණේ අධිකරණයේ අභිමතය යි.

## අතීතයට බොරු කිරීම

ශ්‍රේෂ්ඨාධිකරණය අවලංගු කොට තිබූ, ස්ථාවර නියෝග 78 (ඒ) යටතේ දෝෂ සහගත 'පරීක්ෂණයකින්' අගවිනිසුරුවරිය ඉවත් කිරීම යුක්ති සහගත කර ගැනීමට ගෙනෙන එක තර්කයක් වන්නේ, මේ ස්ථාවර නියෝගය හරහාම අතීතයේ දී වෙනත් විනිසුරුවරුන්වත් 'දෝෂාභියෝගයට' ලක්කොට ඇති බව පෙන්වා දීම යි. මෙය, දත්තමය වශයෙන් ද වැරදි කාරණයකි. දඩිබිඩියේ අටවාගත් මේ ස්ථාවර නියෝග යටතේ තේරීම් කාරක සභාවක් පත්කළ එකම අවස්ථාව වුණේ 1984 යි. අගවිනිසුරු සමරකෝන් විශ්‍රාම යාමට මාසයකට ආසන්නයේ දී ඔහුට විරුද්ධව විෂමාචාර චෝදනාවක් එල්ල කෙරුණි. ඔහු වෙනුවෙන් පෙනී සිටි රාජනීතිඥ එස්. නඩේසන් එම චෝදනාව ප්‍රතික්ෂේප නොකළත්, ස්ථාවර නියෝග යටතේ එය විභාග කිරීමට ඇති ව්‍යවස්ථාමය අයිතිය ප්‍රශ්න කොට සිටියේය. දෙමසක කාලයක් තිස්සේ, අවස්ථා 13 කදී ඒ ගැන ඔහු කරුණු ගෙනහැර දැක්වීමෙන් පසු තේරීම් කාරක සභාව සිය විමර්ශනය අවසන් කරන විට අගවිනිසුරුවරයා විශ්‍රාම ගොස් සිටියේය. එහෙත්, තේරීම් කාරක සභාවේ තීන්දුව වුණේ, ඔහුට විරුද්ධව එල්ල වූ විෂමාචාරය සනාථ වී නැති බවයි.

විනිසුරුවරුන්ගේ හැසිරීම පිළිබඳ විභාග කිරීමට තවත් තේරීම් කාරක සභා දෙකක් අතීතියේ දී පිහිටුවා තිබේ. එහෙත් ඒ වන විට, ස්ථාවර නියෝග 78 (ඒ) නමින් පැනවීමක් තිබුණේ නැත. අනිත් අතට, එම තේරීම් කාරක සභා පත්කෙරුණේ කරුණු විමර්ශනය කිරීමේ අභ්‍යාස වශයෙන් පමණි. ඉන් එක් අවස්ථාවක් වුණේ, හිටපු අභියාචනාධිකරණ විනිසුරුවරයෙකු වූ කේ.සී.ඊ. ද අල්විස් විශේෂ ජනාධිපති කොමිසමක සාමාජිකයෙකු වශයෙන් කටයුතු කිරීම වාරණය කොට, අගවිනිසුරු සමරකෝන් ඇතුළු විමලරත්න සහ කොලින් තෝම් යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් දෙන ලද තීරණයකට එරෙහිව, කේ.සී.ඊ. ද අල්විස් ජනාධිපති ජේ.ආර්.ජයවර්ධන වෙත කරන ලද පැමිණිල්ලක් ප්‍රකාරව, 1983 දී පත්කළ තේරීම් කාරක සභාව යි. දෙවැන්න පත්කෙරුණේ, 1984 අප්‍රේල් මාසයේ ය. ඒ, අගවිනිසුරු සමරකෝන් එක්තරා ස්ථානයක දී, එක්තරා ප්‍රකාශයක් කෙළේ ද යන්න සොයා බලා වාර්තා කිරීම සඳහා පත්කළ තේරීම් කාරක සභාවකි.

2001 ජූනි මාසයේ, අගවිනිසුරු සරත් එන්. සිල්වා ඉවත් කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කිරීමට විරුද්ධ පක්ෂය තැත් කළ අවස්ථාවේ, කුමාරණතුංග ජනාධිපතිනිය පාර්ලිමේන්තු සැසිවාරය විසිරුවා හරිමින් එය ව්‍යර්ථ කළාය. නැවත වරක් එම අගවිනිසුරුවරයාටම එරෙහි චෝදනා විභාග කිරීම සඳහා පොදුරාජ්‍ය මණ්ඩලීය රටවල විනිසුරුවරුන් තිදෙනෙකුගෙන් යුත් විනිශ්චය සභාවක් පත්කිරීමට එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව 2004 දී උත්සාහ කළ අවස්ථාවේ ද, ජනාධිපති කුමාරණතුංග පාර්ලිමේන්තුව විසුරුවා හරිමින් ඒ ප්‍රයත්නයත් ව්‍යර්ථ කළාය.

## වර්තමානය රැවටීම

ව්‍යාජ තොරතුරු බෙදාහැරීමේ වර්තමාන ව්‍යාපාරය තුළ, වෙනත් රටවල පවා පාර්ලිමේන්තුව හරහා විනිසුරුවරුන්ව 'විනිශ්චය' කිරීමට කටයුතු කොට ඇතැ යි කියැවුණි. නිදසුන් සේ ගෙනහැරපෑවේ, විනිසුරුවරයෙකු 'දෝෂාභියෝගයට' ලක්කිරීමේ එකම බලය සෙනේට් සභාවට පැවරෙන, ඇමරිකානු සහ පිලිපීන ව්‍යවස්ථාවන් ය. මේ රටවල් දෙකෙන් එකක හෝ සෙනේට් සභාව, දුරකින්වත් අපේ පාර්ලිමේන්තුවට සමාන නොවන එක කරුණක් තිබේ. එනම්, සෙනේට් සභිකයන් කිසිවෙකු විධායක ධුරයක් නොදරන්නන් වීමයි. කැබිනට් ඇමති මණ්ඩලය මේ රටවල් දෙකේම තෝරාපත් කරගන්නේ, ව්‍යවස්ථාදායකයට පිටතිනි.

ඉතා දක්ෂ ලෙස සාවද්‍ය කරුණු ගෙනහැර දක්වීමට යත්න දැරුණේ, එක්සත් රාජධානිය සම්බන්ධයෙනි. එම රටේ 2005 ව්‍යවස්ථා ප්‍රතිසංශෝධිත පනත යටතේ ඇපැල් අධිකරණයක විනිසුරුවරයෙකු ඉවත් කිරීමේ බලය ඇත්තේ, අගවිනිසුරුවරයාට සහ චාන්සලර් සාමිවරයාට ය. එහෙත් ඒ, අදාළ විනිසුරුවරයාට එරෙහි චෝදනා වෙනත් විමර්ශන විනිසුරුවරයෙකු විසින් විභාග කොට බැලීමෙන් පසු, එම චෝදනා යුක්තිසහගතව සනාථ වී ඇති බවට, අගවිනිසුරු සහ චාන්සලර් සාමිවරයා යන දෙන්නාම එකඟ වෙත් නම් පමණි. උතුරු අයර්ලන්තයේ අගවිනිසුරුවරයා ඉවත් කිරීම පිළිබඳ යෝජනාවක් ඉදිරිපත් කළ හැක්කේ චාන්සලර් සාමිවරයා මගින් පමණි. එය පවා, අදාළ චෝදනා පදනම් සහිත බවට, තුන්කට්ටුවකින් සැදුම්ලත් විනිසුරු මඩුල්ලක් මගින් වාර්තා කිරීමෙන් අනතුරුව ය.  එංගලන්තයේ සහ වේල්සයේ අගවිනිසුරුට (අධිකරණ ප්‍රධානියාට) හෝ එක්සත් රාජධානියේ (සාමි මන්ත්‍රී මණ්ඩලය වෙනුවට පිහිටුවන ලද) ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ට එරෙහි විෂමාචාර චෝදනාවක් විභාග කිරීමේ විධිවිධාන තවම පනවා නැත. කෙසේ වෙතත්, එවැනි අවශ්‍යතාවක් ඇති වෙතොත්, උතුරු අයර්ලන්තය අරභයා අනුගමනය කෙරෙන ක්‍රියා පරිපාටිය පිළිපැදිය යුතු බවට යෝජනා වී තිබේ. අධිකරණමය ආචාර ධර්ම එම රටේ මොන තරම් ගෞරවයට පාත්‍ර වන්නේ ද යත්, ප්‍රජාතන්ත්‍රීය නිර්මිතය කෙතරම් ආරක්ෂා සහිත ද යත්, පාර්ලිමේන්තු සහ අධිකරණමය ක්‍රියා පරිපාටි කෙතරම් පාරදෘශ්‍ය ද යත්, ව්‍යවස්ථාමය සම්මතයන් කෙතරම් ශක්තිමත් ද යත්, එරටේ අගවිනිසුරුවරයා ඉවත් කිරීමේ ප්‍රශ්නයක් කිසි දවසක පැන නැගීමට ඇති ඉඩකඩ ඉතා අල්ප ය.

ආණ්ඩුවේ සාවද්‍ය ප්‍රචාරය තුළ සඟවනු ලැබූ ඊළඟ කරුණ වුණේ, සෑම පොදුරාජ්‍ය මණ්ඩලීය රටකම මේ වන විට 'ලැටිමේර් හවුස්' නිර්දේශ තම තමන්ගේ නීති පද්ධතිය තුළට අන්තර්ග්‍රහණය කරගෙන ඇති බවයි. මේ නිර්දේශ අනුව, පාර්ලිමේන්තු යෝජනාවකින් හෝ වෙනත් ආකාරයකින් විනිසුරුවරයෙකු ඉවත් කළ හැක්කේ, විෂමාචාරය හෝ අබලතාව පිළිබඳ චෝදනාවන් සම්බන්ධයෙන් ස්වාධීන විනිශ්චය මණ්ඩලයක් මගින් ඔහු වරදකරුවෙකු කරනු ලැබීමෙන් පසුව පමණි. ඔස්ට්‍රේලියාවේ සිට උගන්ඩාව, බෙලිස්, බොට්ස්වානා, කැනඩා, සයිප්‍රස්, ඝානා, ගුයනා, ඉන්දියා, කෙන්යා, මැලේසියා, සිංගප්පූරුව සහ දකුණු අප්‍රිකාව වැනි ඕනෑම රටක අනුගමනය කරන ව්‍යවස්ථාමය ප්‍රතිපත්තිය එයයි.

ශ්‍රී ලංකාව සිටින්නේ මේ සම්මතයට පිටිනි. ඒ ශිෂ්ට සම්පන්න භාවයෙන් පිටමං වූ රටක් ලෙසිනි. නාගරික නොවන පාසලකින් අධ්‍යාපනය ලැබ, ශාස්ත්‍රාලීය පුහුණුවක් සහිතව, ශ්‍රී ලංකා ජනරජයේ අගවිනිසුරු පදවියට පත් ප්‍රථම කාන්තාව ඉවත් කිරීම සඳහා, සටන් පාඨ කියන, පොලු මුගුරු උරුක් කරන සහ උමතුවෙන් බෙරිහන් දෙන සැහැසි ජනයාට පොලීසියේ සහ හමුදාවේ සන්නද්ධ ආරක්ෂාව සපයන, දොරටුවලට ඉබි අගුල් දමන, වතුර තුවක්කු මානන, රතිඤ්ඤා පත්තු කරන පරිපාටියක්, ශිෂ්ට සම්පන්න 'ලැටිමේර් හවුස්' නිර්දේශ තුළ නැත. මේ සියලු නිගාවන්ට එරෙහිව, ගර්වයෙන් සහ ධෛර්යයෙන් යුතුව මුහුණදීම, ඇගේ ජීවිතයේ බරපතලම අභියෝගය වූවාට සැක නැත.

## ව්‍යවස්ථාමය ආණ්ඩුකරණයේ අවසානය

සිටින අගවිනිසුරුවරිය ඉවත් කෙළේ යැයි කීම සහ නව අගවිනිසුරුවරයෙකු පත්කෙළ් යැයි කීම, ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාමය ආණ්ඩුකරණයේ නිමාව සනිටුහන් කරන්නේය. පසු ගිය සති හයක කාලය තුළ ආණ්ඩුවේ මූලිකත්වයෙන් දියත් කරන ලද අශෝභන ක්‍රියාවලියක අවසාන කටයුතු ඒවා ය. ඒ සියල්ල කෙරුණේ, මෑත කාලයක අප අත්දැක නැති මට්ටමේ, පෙර නොවූ විරූ, බේගල් ප්‍රවෘත්ති ජාලයක් මැද්දේය. පාර්ලිමේන්තුව තවදුරටත්, ආණ්ඩුව වගවීමකට බැඳ තබා ගත හැකි ව්‍යවස්ථාදායක සභාවක් නොවේ. එහි සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක්, විධායකයෙන් වැටුප් ලබන නිලධාරීන් වීම හේතුවෙන්, එම ආයතනය හුදෙක් විධායකයේ ව්‍යවස්ථාදායක අතකොලුව බවට පත්ව ඇත්තේය. රටේ ඉහළම අධිකරණයේ විනිශ්චය නොතකන, ඉහළම අධිකරණ විනිසුරුවරිය හුදෙක් චණ්ඩ බලයෙන් නෙරපා හැරෙන වටපිටාව තුළ, කාලයක් ප්‍රෞඪත්වයෙන් වැජඹුණු, ස්වාධීනත්වය භුක්ති විඳි, ජාත්‍යන්තර සම්භාවනාවට පත් අධිකරණය, අද සිතාගත නොහැකි මරු පහරකට ලක්ව ඇත්තේය. අප දැන් අරඹා ඇත්තේ, නොහික්මුණු, ඒකාධිපති ජනාධිපති පාලනයකි.